www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ අධිකරනය අපහාස චෝදනා මත විපක්ෂ ජ්‍යෙෂ්ඨ දේශපාලනඥයකු සිරගෙට යවයි

Sri Lankan court jails senior opposition politician for contempt

**කේ. රත්නායක විසිනි**
**2004 දෙසැම්බර් 15**

පසුගිය සතියේ දී ප්‍රමුඛ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හා විපක්ෂ එක්සත් ජාතික පක්ෂයේ (එජාප) ප්‍රධාන සංවිධායක වන එස්.බී. දිසානායක උසාවියට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරුවකු බව තීන්දු කල ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරනය, ඔහුට වසර දෙකක සිර දඬුවමක් නියම කලේ ය. දිවයින දේශපාලන කැලඹිලිවලින් ගහනව පැවතියත්, 1948 ආකාරගත නිදහසෙන් පසු පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරය දරන්නෙකු මෙවන් චෝදනා යටතේ වරදකරු කෙරුනු ප්‍රථම අවස්ථාව මෙය යි.

දෙසැම්බර් 7 දා පංච-පුද්ගල ශ්‍රේෂ්ඨාධිකරන විනිසුරු මඬුල්ලක් ඒකමතිකව මෙම නඩු තීන්දුව දුන්නේ ගිය වසර අග දී රටේ තියුනු දේශපාලන අර්බුදය මැද දිසානායක කල ප්‍රකාශයක් පිලිබඳව ය. එජාපය එකල පාලක එක්සත් ජාතික පෙරමුනු (එජාපෙ) සභාගයේ නායක පක්ෂය වූ අතර රාජ්‍ය බලයේ ලීවරවල පාලනය උදෙසා ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සමග තියුනු ගැටුමක නිමග්නව සිටියේ ය.

එජාපයට එක් වීම පිනිස තමත් ඇමතිවරුන් තිදෙනකු සමග කුමාරතුංගගේ පොදු පෙරමුනු ආන්ඩුවෙන් බිඳීමට පෙරාතුව, 2001 ඔක්තෝබර් තෙක්, දිසානායක එම ආන්ඩුවේ ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකුව සිටියේ ය. ආන්ඩුව බිඳ දැමූ ඔවුන්ගේ එම ක්‍රියාව බැඳී තිබුනේ, රටේ දිග් ගැසෙන සිවිල් යුද්ධය අවසන් කිරීමෙහි ලා පොදු පෙරමුන දැක්වූ අසමත්කම අරබයා පාලක කව තුල ගොනු ගැසෙමින් පැවති අසන්තෘප්තිය සමග ය. ශ්‍රී ලංකා ප්‍රභූවේ කොටස්, බුෂ් ආන්ඩුව "ත්‍රස්තවාදයට විරුද්ධව භූගෝලීය යුද්ධයක්" ප්‍රකාශ කිරීම දුටුවේ, දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට තර්ජනය කිරීමේත් එම සංවිධානය කොලඹ පාලනයේ කොන්දේසි මත සාකච්ඡා මේසයට තල්ලු කර ගැනීමේත් මාධ්‍යයක් ලෙස ය.

එජාපෙ 2001 දෙසැම්බර් හදිසි මැතිවරනය ජයගෙන 2002 පෙබරවාරියේ දී නොර්වේජියානු අතරමැදියන් යටතේ සාම සාකච්ඡා සඳහා ඉඩ සලසනු පිනිස එල්ටීටීඊය සමග සටන් විරාම ගිවිසුමක් අත්සන් කලේ ය. දිසානායක නව ආන්ඩුවේ ඇමතිවරයෙක් ද ජනාධිපති ලෙස සිය තනතුර දිගට ම දැරූ කුමාරතුංගගේ තියුනු විවේචකයෙක් ද බවට පත් විය. ඊනියා සාම ක්‍රියාදාමයට වාචිකව සහයෝගය දුන් නමුදු කුමාරතුංග වඩ වඩා හැරී ගත්තේ මිලිටරිය ද සාම සාකච්ඡා ඒකීය රාජ්‍යය "පාවාදීමක්" ලෙස හෙලා දුටු ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) වැනි සිංහල ස්වෝත්තමවාදී සංවිධාන ද වෙත ය.

සාම සාකච්ඡා පිලිබඳව හටගත් කටුක විවාදය කුමාරතුංග හා ආන්ඩුව අතර විවෘත ගැටුමක් බවට ඉක්මනින් ම වර්ධනය විය. එජාපෙ මහ මැතිවරනය ජය ගෙන තිබූ නමුදු, 1978 ව්‍යවස්ථාව යටතේ, ජනාධිපති ලෙස කුමාරතුංග, ඇමතිවරුන් පත් කිරීමට හා ඉවත් කිරීමටත් ඇමති තනතුරු තමන්ට ම පවරා ගැනීමටත් ඇති අයිතිය ද ඇතුලුව, පුලුල් විධායක බලතල දැරුවා ය. 2003 මුල දී, එල්ටීටීඊයට එරෙහි ප්‍රකෝපකරන මාලාවක දී ඇය මිලිටරිය සමග එකට සිටි අතර එම වසරේ අප්‍රේල් මස සාම සාකච්ඡා අවසාන වසයෙන් කඩාකප්පල් කිරීමෙහි ලා එම ප්‍රකෝපකරන සැලකිය යුතු ක්‍රියාකලාපයක් ඉටු කලේ ය.

ජනාධිපති, අන දෙන නිලධාරිනිය ලෙස ද ව්‍යවස්ථාව යටතේ ද මිලිටරිය මෙහෙයවීමේ අයිතිය ඇත්තේ තමාට බව අවධාරනය කරමින්, එජාපෙ ආරක්ෂක ඇමති විවෘතව ම නොතකා හැරියා ය. ජනාධිපති සහ ආන්ඩුව මිලිටරියේ. පොලීසියේ හා රාජ්‍ය තන්ත්‍රයේ අනෙකුත් මූලික අංශවල පාලනය සඳහා තරග වැදුනු තතු යටතේ 2003 වසරේ ඉතිරි කාලය මුලුල්ලේ ම තියුනු ගැටුමක් පැවතුනි. 2003 මැයි මස දී, කුමාරතුංග, දේශපාලන හිතවතුන්ට නොයෙකුත් පගා දීම සඳහා යොදා ගැනෙන මහා ධන නිධානයක් වන සංවර්ධන ලොතරැයි මන්ඩලය පවරා ගත්තා ය.

ආන්ඩුව ජනාධිපතිගේ පියවරයන් හරස් කිරීමට උත්සාහ කලේ, විශ්‍රාම යාමට නියමිතව සිටි, එජාපෙට හිතවත් ජ්‍යෙෂ්ඨ මිලිටරි නිලධාරින්ගේ සේවය දීර්ඝ කිරීම මගිනි. එසේ කිරීමට බලය ඇත්තේ ජනාධිපතිට

ද නැත හොත් ආරක්ෂක ඇමතිට ද යන වග තීන්දු කරනු පිනිස ජනාධිපති ශ්‍රේෂ්ඨාධිකරනයේ "උපදෙස්" ඉල්ලා සිටියා ය. අග්‍ර විනිශ්චයකරු වූයේ ඇය විසින් ම පත් කල අයෙකි. එනම්, 1999 දී විවෘත විරෝධතා මධ්‍යයේ පත් කෙරුනු සරත් එන්. සිල්වා ය. කුමාරතුංග තමන්ගේ සමීප විශ්වාසවන්තයකු ලෙස සැලකුනු අයෙකු තෝරා ගනු වස් වඩා ජ්‍යෙෂ්ඨ විනිසුරුවරුන් ගනනාවකට උඩින් පැන සිල්වා පත් කලේ ඔහුට එරෙහිව පැන නැගී පැවති දූෂිත ක්‍රියා පිලිබඳ චෝදනා ද නොතකා හරිමිනි.

2003 ඔක්තෝබරයේ ශ්‍රේෂ්ඨාධිකරන නඩු විභාගය සිදු වූයේ අතිශයින් ම ආතති සහගත දේශපාලන වාතාවරනයක් තුල ය. එල්ටීටීඊය සාම සාකච්ඡා යලි ඇරඹීම සඳහා වූ සිය යෝජනා නිවේදනය කිරීමට සූදානම් වෙමින් සිටි අවස්ථාවේ, ආන්ඩුව ජාතික ආරක්ෂාවට වල කපමින් රට පාවා දීමට සූදානම් වන බව ප්‍රකාශ කරමින්, කුමාරතුංග, ඇගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) සහ ජවිපෙ, දුෂ්ට වර්ගෝත්තමවාදී උද්ඝෝෂනයක් ගෙන ගියේ ය. එජාපෙ, ඔවුන්ගේ පාර්ශ්වයෙන්, පාර්ලිමේන්තුව හරහා අග විනිසුරුට හා ජනාධිපතිට එරෙහිව පියවර ගන්නා බවට තර්ජනය කරමින් සිටියේ ය.

ඔක්තෝබර් 31 දා, අධිකරනයට මැදිහත් වීමට බලයක් නැති බවට තර්ක කල නීතිපති කේ.සී. කමලසබේසන් සමග අග විනිසුරු සිල්වා උනුසුම් විවාදයක යෙදුනේ ය. සිල්වා, එම තර්කය ප්‍රතික්ෂේප කලේ පක්ෂග්‍රාහී ලෙස මෙසේ ප්‍රකාශ කරමිනි: "ජාතික ආරක්ෂාව සම්බන්ධයෙන් මතු වී ඇති ගැටලුව පිලිබඳ විභාගය රටේ ස්වෛරී භාවය පිලිබඳ කාරනාවකි. වර්තමානයේ දී විධායක ජනාධිපතිගේ බලතල අනතුරට ලක්ව ඇත."

දින කිහිපයක් ඇවෑමෙන්, අධිකරනය මිලිටරිය මත කුමාරතුංගගේ පාලනය සහතික කරමින් ආරක්ෂක ඇමතිගේ ක්‍රියාවන් "බලාතික්‍රමන, නොවලංගු සහ නීතිය තුල කිසිදු බලයක් හෝ සහයෝගයක් නැති" පියවරයන් බව ප්‍රකාශ කර සිටියේ ය.

දිසානායක ශ්‍රේෂ්ඨාධිකරනයේ ක්‍රියාවන් විවේචනය කලේ මෙම සන්දර්භය තුල ය. 2003 නොවැම්බර් 3 දා හබරාදුවේ දී පැවති වාර්ෂික වප් මගුල් උත්සවයක කතා කරමින්, ඔහු කියා සිටියේ ආන්ඩුව ශ්‍රේෂ්ඨාධිකරනයේ මැදිහත් වීමට විරුද්ධ වන අතර එහි තීන්දුව පිලි නොගන්නා බව යි.

කෙසේ වෙතත්, දේශපාලන සිදුවීම් වේගයෙන් වර්ධනය විය. එදින ම මධ්‍යම රාත්‍රියේ දී, කුමාරතුංග, ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුවෙන් දිරිමත්ව, මූලික අමාත්‍යංශ තුනක් -- ආරක්ෂක, අභ්‍යන්තර කටයුතු හා ජන මාධ්‍ය -- නිල වසයෙන් පවරා ගත්තා ය. පසුදින ඇය ආන්ඩුවේ ආයතන හා තානාපති කාර්යාල අවට හමුදා බල ඇනි යොදවා හදිසි නීති රෙගුලාසි පැනවීමේ සිය අභිප්‍රාය ද නිවේදනය කලා ය. ඇගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවර, "ජාතික ආරක්ෂාව" රැකීමේ නාමයෙන් යුක්තියුක්ත කිරීමට උත්සාහ කල ව්‍යවස්ථාමය කුමන්ත්‍රනයක සියලු අංග ලක්ෂන දැරි ය.

වොෂිංටනයෙන් හා නව දිල්ලියෙන් එල්ල වූ පීඩනය යටතේ, කුමාරතුංග හදිසි නීතිය පැනවීමෙන් පසුබැස්ස නමුදු, අමාත්‍යංශ තුන සියතේ ම තබා ගත්තා ය. එජාපෙ සමග පැවති දිග්ගැසුනු සාකච්ඡාවලින් කිසියම්ම සම්මුතියකට එලඹීමට අපොහොසත් වීමෙන් අනතුරුව, ජනාධිපති තනි මතයට ආන්ඩුව බලයෙන් පහ කොට 2004 අප්‍රේල් මාසයේ දී නව මැතිවරනයක් පැවැත්වෙන බව නිවේදනය කලා ය. ඇගේ ශ්‍රීලනිපය, ජවිපෙ සහ කුඩා පක්ෂ ගනනාවක් සමග සන්ධානගතව, මැතිවරනය යන්තමින් ජයගෙන සුලුතර ආන්ඩුවක් පිහිටුවී ය.

## දිසානායකට එරෙහිව චෝදනා ගොනු කෙරෙයි

දිසානායක කල ප්‍රකාශ අමතක කෙරුනේ නැත. හබරාදුව ප්‍රදේශයේ ශ්‍රීලනිප ක්‍රියාකාරීන් දෙදෙනෙක් ඔහුගේ කතාව සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරනයට පෙත්සමක් ඉදිරිපත් කල අතර ඔහුට එරෙහිව නැඟුනු අධිකරනයට අපහාස කිරීම පිලිබඳ චෝදනාවට පදනම වූයේ එය යි. මුල දී තමන් එවන් ප්‍රකාශ සිදු නොකල බව පැවසූ දිසානායක පසුව වරද පිලිගෙන සමාව ඉල්ලුවේ අධිකරනයට අගෞරව කිරීමේ කිසිදු අභිප්‍රායක් තමන්ට නො තිබූ බව ද කියා සිටිමිනි. අතරමැදියන් හරහා රහසේ සම්මුතියක් ඇති කර ගැනුනු බවත් ඒ අනුව ඔහු ලිහිල් දඬුවමක් බලාපොරොත්තු වූ බවත් කොලඹ මාධ්‍ය වාර්තා කලේ ය.

එහෙත් සිල්වාගේ නායකත්වයෙන් යුත් ශ්‍රේෂ්ඨාධිකරන විනිසුරු මඬුල්ල, දිසානායක අධිකරනය සමච්චලයට ලක් කොට එය බිය ගැන්වීමටත් එයට එරෙහිව මහජන මතය ඇවිස්සීමටත් ප්‍රයත්න දරා ඇතැයි ප්‍රකාශ කලේ ය. එහි තීන්දුවෙන් 1978 ව්‍යවස්ථාව යටතේ ජනාධිපති සහ ඉහල උසාවිය භුක්ති විඳින පුලුල් බලතල යලි තහවුරු කොට බ්‍රිතාන්‍ය හා ඉන්දියානු ව්‍යවස්ථා මත පදනම් වූ තර්ක ප්‍රතික්ෂේප කෙරුනි. ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරනයට "ව්‍යවස්ථාව අර්ථකථනය කිරීමට සම්බන්ධිත ඕනෑම ගැටලුවක් විභාග කිරීමටත් ඒ ගැන තීන්දු කිරීමටත් තනි හා අනන්‍ය අධිකරන බලයක්" ඇතැයි නඩු තීන්දුවෙන් ප්‍රකාශ කෙරුනි.

ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුවට දුර-දිග යන දේශපාලන ඇඟවුම් පවතී. දිසානායක සම්බන්ධයෙන් ගත හොත්, එයින් අදහස් කෙරෙන්නේ වසර දෙකක සිර දඬුවමක් පමනක් නොව, පාර්ලිමේන්තුවට තරග කිරීමට හා ඡන්දය දීමට පවත්නා අයිතිය ද ඇතුලු සිවිල් අයිතීන් වසර හතකට අහිමි වීම යි. ඔහු ඉදිරියේ පවත්නා එක ම ගැලවීමේ මග වන්නේ ජනාධිපති සමාවක් ඉල්ලා කුමාරතුංගට ආයාචනා කිරීම යි. එහෙත් දිසානායක එජාපයට එක් වූ අවස්ථාවේ පටන් කුමාරතුංග ඔහු

සම්බන්ධයෙන් දරුනු සතුරු ආකල්පයක් දරන අතර ඇය සිය දේශපාලන සතුරා නිදහස් කිරීම විය නොහැක්කකි.

වඩාත් අති මූලිකව ගත් කල, කුමාරතුංග තමන්ට දිගට ම බලයේ සිටීමට ඉඩ සලසනු ඇති මතභේදයට තුඩු දෙන ප්‍රජාතන්ත්‍ර විරෝධී ව්‍යවස්ථා සංශෝධන පිලිබඳව සලකා බලමින් සිටින අවස්ථාවක ම නිකුත් වූ ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුව, ව්‍යවස්ථාමය කරුනු සම්බන්ධයෙන් තීරන ගැනීමට එයට ඇති අයිතිය තහවුරුව ප්‍රකාශ කර ගනිමින් ජනාධිපතිගේ බලතල ද යලි සහතික කර සිටී. දිසානායක සිර ගෙට යැවීම මගින්, අධිකරනය, සිය ක්‍රියාවන් පිලිබඳ සියලු අනාගත විවේචකයන්ට බරපතල අනතුරු ඇඟවීමක් කර ඇත.

1994 සිට බලයේ සිටින කුමාරතුංගට, වත්මන් ව්‍යවස්ථාව යටතේ, ජනාධිපති ලෙස බලයේ සිටිය හැක්කේ වාර දෙකකට පමනි. 1999 ජනාධිපතිවරනය ජයගැනීමෙන් පසුව ඇය නිල වසයෙන් දෙවන වාරය සඳහා බලයේ පිහිටුවුනි. කෙසේ වෙතත්, එයින් වසරක් ඇවෑමෙන්, අග විනිසුරු සිල්වා ඉදිරියේ පැවති රහස් උත්සවයක දී ඇය දෙවන වතාවට ද තනතුරේ දිවුරුම් දුන් අතර දැන් ඇය අවධාරනය කරන්නේ 2005 අග නොව ඒ වෙනුවට 2006 දක්වා තනතුරේ රැඳී සිටීමට තමන්ට හැකි බව යි.

2006න් පසුව ද බලයේ සිටිනු පිනිස, විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට ඒ වෙනුවට පාර්ලිමේන්තු ක්‍රමය යලි ගෙනඑනු පිනිස ව්‍යවස්ථාව වෙනස් කිරීමේ කුරුමානමක ද කුමාරතුංග යෙදී සිටින්නී ය. සමානුපාතික ඡන්ද ක්‍රමය ද යම් වෙනසකට භාජන කරනු ඇති මෙම සංශෝධනවල එල්ලය වන්නේ පාර්ලිමේන්තුව තුල ශ්‍රීලනිපයේ බලය ශක්තිමත් කර ගැනීම සහ ඇයට අගමැති ලෙස බලයට පත් වීමට ඉඩ සලසා ගැනීම යි.

වර්තමානයේ දී. පාලක සභාගයට — එක්සත් ජනතා නිදහස් සන්ධානයට (එජනිස) — ව්‍යවස්ථා සංශෝධනයක් සඳහා අවශ්‍ය තුනෙන් දෙකක පාර්ලිමේන්තු බහුතරය නැත. කෙසේ වෙතත්, කුමාරතුංග සහ ඇගේ සගයෝ, බොරු ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක් කැඳවීම හෝ ජනමත විචාරනයක් පැවැත්වීම මගින් මෙම ව්‍යවස්ථාමය අවශ්‍යතා මග හැරීමේ යෝජනා ගනනාවක් ම තොරොම්බල් කිරීමක යෙදී සිටී.

ජවිපෙ ඊටත් එහා යමින් තර්ක කලේ, මැතිවරනය වනාහි "මහජන කැමැත්ත" ප්‍රකාශයට පත් වීමක් වූ නමුත්, අසාධාරන ඡන්ද ක්‍රමයක් මගින් එය උඩු යටිකුරු කෙරී ඇති බව යි. එජනිසයට තුනෙන් දෙකක ඡන්දයක් ලැබුනු බව — එය ම පැහැදිලි සාවද්‍ය ප්‍රකාශයකි — කියාපාමින් ජවිපෙ ප්‍රකාශ කලේ ව්‍යවස්ථාවේ නියමිත අවශ්‍යතාවන්ට එරෙහිව පවා, ව්‍යවස්ථා සංශෝධන ගෙන ඒමේ සදාචාරමය අයිතියක් ආන්ඩුවට ඇති බව යි.

මැතක් වන තුරු ම, එජනිසයට සරල පාර්ලිමේන්තු බහුතරයක් පවා නො තිබුනි. බලගතු කතානායක තනතුර සඳහා එය ඉදිරිපත් කල අපේක්ෂකයා පරාජයට පත් වූ අතර එම තනතුර විපක්ෂය අතට ගියේ ය. කතානායක තනතුරේ බලය නොමැති තතු යටතේ පාර්ලිමේන්තුව "ව්‍යවස්ථා සම්පාදක මන්ඩලයක්" ලෙස ප්‍රකාශයට පත් කිරීමට පියවර ගැනීම එජනිසයට මුලුමනින් ම පාහේ කල නොහැකි දෙයක් බවට පත්ව ඇත. සැප්තැම්බරයේ දී, දෙමල කතා කරන වතු කම්කරුවන් අතර පදනම් වූ දේශපාලන පක්ෂයක් හා වෘත්තීය සමිතියක් වන ලංකා කම්කරු කොංග්‍රසය (සිඩබ්ලිව්සී), ඇමති තනතුරු දෙකකට හිලව් වසයෙන්, විපක්ෂය අතහැර ආන්ඩුවට එක් වී ඊට යන්තම් බහුතරයක් ලබා දුනි.

දැන්, වඩාත් ම මතභේදාත්මක ක්‍රම යොදා ගනිමින්, ව්‍යවස්ථාමය වෙනස්කම් යලිත් න්‍යාය පත්‍රයට ඇතුලු කර තිබේ. පසුගිය සතියේ අයවැය විවාදය තුල දී, ව්‍යවස්ථා කටයුතු පිලිබඳ ඇමති ඩිව් ගුනසේකර, රට මුහුන දෙන හැම ප්‍රශ්නයකට ම මුල වත්මන් ව්‍යවස්ථාව යයි ප්‍රකාශ කරමින්, ව්‍යවස්ථා සංශෝධන සැලසුම් සමාලෝචනය කලේ ය.

වත්මන් කතානායකට විරුද්ධව විශ්වාස භංග යෝජනාවක් ගෙන ඒමේ අදහසක් ඇතැයි ද එජනිසය පසුගිය සතියේ දී නිවේදනය කලේ ය. තම මන්ත්‍රීවරයකු කතානායක ලෙස පත් කිරීමෙන්, පාර්ලිමේන්තු න්‍යාය පත්‍රයේ පාලනය යලි ඩැහැ ගැනීමට ආන්ඩුව බලාපොරොත්තු වේ. එජනිස හවුල්කරුවන් ගනනාවක් ඒ පිලිබඳව සිය නොඑකඟතාවන් ප්‍රකාශයට පත් කිරීම හේතු කොට ගෙන මෙම සැලසුම් තාවකාලිකව අත්හිටුවා තිබේ.

ජවිපෙ මෙම ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන් තුල ප්‍රධාන ක්‍රියාකලාපයක් ඉටු කරයි. දිසානායක සිර ගෙට යැවීමට විරෝධය දක්වමින් එජාප මන්ත්‍රීවරු ගිය සතියේ පාර්ලිමේන්තුව තුල ගාලගෝට්ටියක් සිදු කල අවස්ථාවේ දී, ජවිපෙ නායක විමල් වීරවංශ, සභාවේ කටයුතු ඉදිරියට ගෙන යාමට අපොහොසත් වීම සම්බන්ධයෙන් කතානායකට හා දක්ෂිනාංශික එජාපයට එරෙහිව වාචාල හෙලාදැක්මක යෙදී ගත්තේ ය. ඔහු පසුව දෙසැම්බර් 8 දා පැවති ප්‍රවෘත්ති සාකච්ඡාවක දී කතානායක තනතුරෙන් ඉවත් කල යුතු යයි ඉල්ලා සිටියේ ය.

පසුගිය ඉරිදා මාතර දී කල කතාවක, කුමාරතුංග එජාපය වෙත තර්ජනාත්මක අනතුරු ඇඟවීමක් නිකුත් කලා ය. තමන්ගේ මන්ත්‍රීවරුන් හික්මවා ගන්නා ලෙසත් "ශ්‍රේෂ්ඨාධිකරනය විසින් දෙනු ලැබූ නිවැරදි හා ස්වාධීන තීන්දුවක් වෙනස් කිරීමට" ඔවුන් දරන තැත නතර කරන ලෙසත් විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහට ඇය කියා සිටියා ය. ඇය ප්‍රකාශ කර සිටියේ ඔහුට නොහැකි නම් එජාප මන්ත්‍රීන් මට්ටු කිරීමට ආන්ඩුවට බල කෙරෙනු ඇති බව ය.

දිසානායක සිරගෙට යැවීම, අප්‍රේල් මැතිවරන

පරාජයට පසුව, එජාපය තුලට යම් ආකාරයක ජීවන හුස්මක් යලි ඇතුලු කර තිබේ. මෙම තත්වාරක්ෂක පක්ෂයට ඔවුන්ගේ ම ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවන් පිලිබඳ දීර්ඝ ඉතිහාසයක් පවතී. කෙසේ වෙතත්, වික්‍රමසිංහ “ප්‍රජාතන්ත්‍රවාදය” තර්ජනයට ලක්ව ඇතැයි ප්‍රකාශ කිරීමට ද බන්ධනාගාරගත කල පක්ෂයේ සංවිධායකයා නිදහස් කර ගැනීමේ උද්ඝෝෂනයක් දියත් කිරීමට ද අවස්ථාව ඩැහැ ගෙන තිබේ.

මෙම සියලු ම උපාමාරු සිදු වෙමින් පවතින්නේ අස්ථාවර දේශපාලන තත්වයක් තුල ය. මැතිවරනයෙන් පසුව, සාම සාකච්ඡා යලි ඇරඹීමට උත්සාහ කිරීමේ කුමාරතුංගගේ තීන්දුව සම්බන්ධයෙන් පාලක සභාගය තුල තියුනු ආතතීන් මතුව පවතී. ආන්ඩුව බැරෑරුම් මූල්‍ය අර්බුදයකට මුහුන දී සිටින අතර සිය මැතිවරන පොරොන්දු ඉටු කිරීමට එය අසමත්ව ඇත. පැවති එජාපෙ ආන්ඩුවේ ආර්ථික ප්‍රතිව්‍යුහකරන සැලසුම් සම්බන්ධයෙන් පැතිර ඇති විරුද්ධත්වය ගසා කා ඇති එජනිසය, දැන් යන්තම් අට මසක් ඇවෑමෙන් ජීවන මට්ටම් පහල වැටීමට එරෙහිව නැගෙන විරෝධතා හා වර්ජන මාලාවකට මුහුන දී සිටී.

මෙම තතු තුල, පාලක සභාගය කැඩී බිඳී යාම හෝ ව්‍යවස්ථාව වෙනස් කිරීමට ආන්ඩුව දරන තැතට විරුද්ධව දේශපාලන හා නීතිමය ගැටීම් හට ගැනීම වැනි ප්‍රධාන පෙලේ නව දේශපාලන අර්බුදයක් ඇවිලීමේ අන්තරායන් මතුව තිබේ. අවසාන විග්‍රහයේ දී, දිසානායක සිරගෙට යැවීමේ ශ්‍රේෂ්ඨාධිකරන තීන්දුව, එලඹෙන දේශපාලන කුනාටු සඳහා — අන් සියල්ලට මත් වඩා කම්කරු පන්තියේ මොන යම් හෝ ව්‍යාපාරයකට විරුද්ධව — ශ්‍රේෂ්ඨාධිකරනයේ ද සමස්තයක් ලෙස පාලක පන්තියේ ද අත ශක්තිමක් කර ගැනීමේ බලපෑමෙන් යුක්ත කාරනයකි.

© www.wsws.org